Sri Lanka's Largest Past Pa... ...olee.com
ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/



*සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved ]*

## ඇගයීම් පරීක්ෂණය

## Evaluation Test

**7 ශ්‍රේණිය**

**Grade 7**

ගණිතය **I, II**
கணிதம் **I,II**
**Mathematics I,II**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
**Two hours**

විභාග අංකය : .....................................

### I කොටස

ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

1. O කේන්ද්‍රය වූ වෘත්තයේ විෂ්කම්භය සොයන්න




2. රූපයේ දැක්වෙන සමපාද ත්‍රිකෝණයේ සමමිති අක්ෂ සියල්ල ඇඳ දක්වන්න.



3. සුළු කරන්න.

| | $g$ | $mg$ |
|---|---|---|
| | 5 | 630 |
| + | 3 | 725 |
| | | |

4. $5 \times 5 \times 5 \times 5 \times 5$ දර්ශක ආකාරයෙන් ලියන්න.

5. පහත දැක්වෙන්නේ එක් කොටුවක දිග හා පළල $1cm$ බැගින් වන සමචතුරස්‍රාකාර කොටු ජාලයක් මත අඳුරු කර ඇති රූපයකි. එහි වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීයද ?



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**6.** කොටු වල ඇති $a$ හා $b$ මගින් දැක්වෙන අක්ෂර වෙනුවට ගැලපෙන සංඛ්‍යා ලියන්න.

$$2\frac{a}{4} = \frac{11}{b}$$

$a =$ ............

$b =$ ............

**7.** පහත රූප අතුරින් අවතල බහු අස්‍ර හැඩය ඇති රූප තෝරා ඒවායේ අක්ෂර ලියන්න




**8.** 2387 යන සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය සොයන්න.

**9.** පහත දක්වා ඇති දින අතරින් 19 වන සියවසට අයත්වන දිනය කුමක් ද ?

1975-01-03 1872-12-05 1800-01-02 1905-06-03

**10.** සුපුන් $x + 3 = 5$ සමීකරණය විසඳීමට අඳින ලද අසම්පූර්ණ ගැලීම් සටහනක් පහත දැක්වේ.එය සම්පූර්ණ කර සමීකරණය විසඳන්න.




**11.** භාජනයක ඇති ද්‍රව ප්‍රමාණය $7l\ 350ml$ කි. එම ද්‍රව ප්‍රමාණය මිලි ලීටර වලින් කොපමණද ?

**12.** සුළු කරන්න. $3\frac{5}{7} - 1\frac{2}{7}$

**13.** $A =$ {CORONA යන වචනයේ අක්ෂර } නම් මෙම කුලකය වෙන් රූප සටහනක දක්වන්න.

**14.** $35m$ දිග කම්බි රෝලකින් $20m\ 80cm$ ක ප්‍රමාණයක් කපා ඉවත් කළ විට ඉතිරි කොටසේ දිග සොයන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**15.** 8, 12, 16 යන සංඛ්‍යා තුනෙහි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

**16.** $0 \cdot 25$ යන දශම සංඛ්‍යාව

i) භාගයක් ලෙස ලියන්න.

ii) ඔබ ලියූ භාගය සරලම ආකාරයෙන් දක්වන්න.

**17.** කෝණමානය හා සරල දාරයක් භාවිතයෙන් $O$ ලක්ෂ්‍යයේදී $75^0$ ක කෝණයක් ඇඳ එය $B\hat{O}C$ ලෙස නම් කරන්න.




**18.** සුළු කරන්න. $(-7) + (+3)$

**19.** පහත දැක්වෙන ඝනකාභයේ පරිමාව සොයන්න.




**20.** මා ළඟ ඇති මුදලේ දෙගුණයට වඩා රුපියල් 5 ක් වැඩියෙන් මල්ලී ළඟ ඇත. මා ළඟ ඇති මුදල $a$ ලෙස සලකා මල්ලී ළඟ ඇති මුදල $a$ ඇසුරින් ලියා දක්වන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**II කොටස**

**ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

**1.** a) සුළු කරන්න.

i)

| $kg$ | $g$ |
|---|---|
| 7 | 375 |
| + 9 | 830 |

ii) $8\,g\ 400\,mg\ \div 7$

iii)

| $m$ | $cm$ |
|---|---|
| 6 | 9 |
| - 4 | 53 |

b) කොඩියක් මැසීමට රෙදි $1\,m\ 25\,cm$ ක ප්‍රමාණයක් අවශ්‍ය වේ.

i) එවැනි කොඩි 8 ක් මැසීමට අවශ්‍ය මුළු රෙදි ප්‍රමාණය සොයන්න.

ii) රෙදි මීටර 1 ක මිල රු. 120 ක් නම් කොඩි 8 මැසීම සඳහා අවශ්‍ය මුළු රෙදි ප්‍රමාණයේ වටිනාකම සොයන්න

**2.** a) (i) $A=\{$1 ත් 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා $\}$ කුලකයේ අවයව වෙන් රූප සටහනක දක්වන්න.

(ii) $P=\{$"COMMUNICATION" යන වචනයේ අකුරු $\}$ කුලකය අවයව සහිතව සඟල වරහන් තුල ලියා දක්වන්න.

b) (i) අඩු කරන්න.

| අවු | මාස | දින |
|---|---|---|
| 7 | 03 | 12 |
| - 2 | 09 | 27 |

(ii) අමල්ගේ ගණිත පන්තිය පෙ.ව. 10.05ට ආරම්භ වී ප.ව. 1.15 ට අවසන් විය. විද්‍යාව පන්තිය ප.ව. 1.55 ට ආරම්භ වී ප.ව. 4.30 ට අවසන් විය. වැඩි කාලයක් පැවතියේ කුමන පන්තිය දැයි සොයන්න.

**3.** i) පහත දැක්වෙන භාග යුගල $=,<,>$ යොදා සම්බන්ධ කරන්න.

$\frac{3}{5}$ ....... $\frac{2}{3}$

ii) පහත දැක්වෙන භාග ආරෝහණ පටිපාටියට සකසා ලියන්න.

(a) $\frac{7}{12}, \frac{5}{12}, \frac{11}{12}, \frac{1}{12}$  (b) $\frac{11}{5}, \frac{11}{7}, \frac{11}{2}, \frac{11}{3}$

iii) සුළු කරන්න.

$\frac{1}{4}+\frac{1}{6}+\frac{1}{3}$

iv) සුළු කරන්න.

$6\frac{2}{5} - 2\frac{1}{10}$

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**4.** (i) 32 , පාදය 2 වූ දර්ශක අංකනයෙන් ලියන්න.

(ii) $a = 2$ ද $b = 3$ ද වන විට $5a^2b$ ප්‍රකාශනයේ අගය සොයන්න.

(iii) හිස්තැන් සඳහා සුදුසු අගයයන් ලියන්න.




(iv) $(-6) + (+2)$ හි අගය සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සොයන්න.

**5.** (i) දී ඇති සංයුක්ත තල රූපයේ වර්ගඵලය සොයන්න.




(ii) රූපයේ දක්වා ඇති පරිදි දිග $8\ m$ ද , පළල $6\ m$ ද වන සෘජුකෝණාශ්‍රාකාර ඉඩමක පැත්තක දිග $4\ m$ ක් වන සමචතුරස්‍රාකාර පොකුණක් ඉදිකර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණයේ තණකොළ වවා ඇත. තණ කොළ වවා ඇති බිම් ප්‍රමාණයේ වර්ගඵලය සොයන්න.




(iii) දිග $10\ m$ , පළල $8\ cm$ සහ උස $6\ m$ වන ඝනකාභ හැඩති ජල ටැංකියක ධාරිතාව සොයන්න.

(iv) ධාරිතාව $72\ m^3$ වන ඝනකාභාකාර ජල ටැංකියක දිග $9\ m$ ක් ද පළල $2m$ ක් ද වේනම් ටැංකියේ උස ගණනය කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**6.** (i) පහත දැක්වෙන ත්‍රිකෝණයේ පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ලියා සුළු කරන්න.




(ii) $x$ හි අගය ඒකක 10 නම් ඉහත ත්‍රිකෝණයේ පරිමිතිය ඒකක කීය ද ?

(iii) සුපුන්ට රු. 35 බැගින් වූ අභ්‍යාස පොත් 5 ක් ද පැන්සලක මිල රු. $b$ වූ පැන්සල් 2 ක් ද මිලට ගැනීමට රු.215 ක් වැය විය. මෙම තොරතුරු සමීකරණයකින් දක්වන්න.

(iv) ඉහත සමීකරණය විසඳා පැන්සලක මිල සොයන්න.

**7.** (i) 52☐ යනු ඉලක්කම් තුනකින් යුත් 3 න් බෙදෙන සංඛ්‍යාවකි. හිස්තැනට ගැලපෙන ඉලක්කම් 2ක් ලියන්න.

(ii) 36 හි සාධක 6 ක් ලියන්න.

(iii) 12 ,18, 24 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

(iv) රාත්‍රී සාදයකදී මිනිත්තු 4 කට වරක් රතු බල්බ ද මිනිත්තු 6 කට වරක් කොළ බල්බ ද මිනිත්තු 9 කට වරක් නිල් බල්බ ද දැල්වෙයි. එක් වේලාවක එම වර්ණ තුනේම බල්බ එකවර දැල්වුණු අතර නැවත එකම වේලාවක බල්බ තුනම දැල්වෙන්නේ කොපමණ කාලයකට පසුව ද ?

**8.** (i) පහත දක්වා ඇති කෝණයට අදාල කෝණ වර්ගය ලියා දක්වන්න.

(a) $112^0$ (b) $180^0$

(ii) $A\hat{B}C = 125^0$ වන කෝණය කෝණමානය භාවිතාකර ඇඳ දක්වන්න.

(iii) (a) සවිධි බහු අස්‍රයක් යනු කුමක් ද ?

(b) දී ඇති රූප සටහන් අතරින් සවිධි බහු අස්‍රය තෝරා එහි අක්ෂරය ලියා දක්වන්න.



(iv) පාද වල දිග අනුව හා කෝණ වල විශාලත්වය අනුව පහත අඳ දක්වා ඇති ත්‍රිකෝණ සඳහා සුදුසු නාමයන් ලියන්න.

(a)




(b)




(c)






* * *